පීපල්ස් ඉන්ෂුරන්ස් පීඑල්සී - 2024

--

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

පීපල්ස් ඉන්ෂුරන්ස් පීඑල්සී හි ("සමාගම") 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මෙම විගණනය සඳහා ප්‍රසිද්ධ වෘත්තියෙහි යෙදී සිටින වරලත් ගණකාධිකාරී සමාගමක සහාය මා ලබා ගන්නා ලදී.

සමාගමේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්:

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව;

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව; සහ

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

විගණන නිරීක්ෂණය	කළමනාකරණයේ අදහස් දැක්වීම	නිර්දේශය
අ. ලැබිය යුතු ප්‍රතිරක්ෂණ මුදල් සහ ගෙවිය යුතු ප්‍රතිරක්ෂණ මුදල් සඳහා පද්ධතියෙන් ජනනය කරන ලද වයස්ගත විශ්ලේෂණයක් සේවාදායකයා විසින් පවත්වාගෙන නොයන බව නිරීක්ෂණය විය. එවැනි ව්‍යුහගත විශ්ලේෂණයක් නොමැතිකම ප්‍රතිරක්ෂණකරුවන්ගේ හිඟ මුදල් තත්ත්වය පිළිබඳ පුළුල් දැක්මක් ලබා ගැනීමේ හැකියාව සීමා කරයි. පද්ධතියෙන් ජනනය කරන ලද වයස්ගත විශ්ලේෂණය යනු ශේෂයන්ගේ නිරවද්‍යතාවය සහ විනිවිදභාවය සහතික කිරීම, ගෙවිය යුතු මුදල් කලට වේලාවට පියවීමට සහාය වීම සහ දිගු කලක් හිඟව පවතින හෝ මතභේදයට තුඩු දී ඇති අයිතම කලින් හඳුනා ගැනීම සඳහා වූ තීරණාත්මක මෙවලමකි.	සටහන් කර ගන්නා ලදී. ගෙවිය යුතු ප්‍රතිරක්ෂණ මුදල් සඳහා වයස්ගත වීම ලබා ගැනීම සඳහා පද්ධති සංවර්ධනයක් සිදු කර ඇති අතර එය දැනට පරීක්ෂණ අදියරේ පවතී. ඉන්පසුව, ලැබිය යුතු ප්‍රතිරක්ෂණ මුදල් සඳහා වයස්ගත වීම ලබා ගැනීම සඳහා පද්ධතිය සංවර්ධනය කරනු ඇත. මෙය 2025 ඔක්තෝබර් 31 දින වන විට අවසන් කරනු ඇත.	කළමනාකාරීත්වය විසින් ලැබිය යුතු ප්‍රතිරක්ෂණ මුදල් සහ ගෙවිය යුතු ප්‍රතිරක්ෂණ මුදල් සඳහා පද්ධතියෙන් ජනනය කරන ලද වයස්ගත විශ්ලේෂණයක් ක්‍රියාත්මක කළ යුතු බව නිර්දේශ කෙරේ. හිඟ ශේෂ නිවැරදිව අධීක්ෂණය කිරීම, ගෙවිය යුතු මුදල් කලට වේලාවට පියවීම සහ දිගු කලක් හිඟව පවතින හෝ මතභේදයට තුඩු දී ඇති අයිතම කලින් හඳුනා ගැනීම සහතික කිරීම සඳහා මෙය මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලියට ඒකාබද්ධ කළ යුතුය.

1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

1.6.1 ලැබිය යුතු මුදල්

විගණන නිරීක්ෂණය	කළමනාකරණයේ අදහස් දැක්වීම	නිර්දේශය
අ. ගෙවන ලද හිමිකම් මත අයකර ගත හැකි රු. මිලියන 105.5 ක් වූ ප්‍රතිරක්ෂණ දින 365 කට වඩා වැඩි කාලයක් හිඟව පවතින බව නිරීක්ෂණය විය. මෙම ශේෂයෙන් රු. මිලියන 73 ක් විදේශීය ප්‍රතිරක්ෂණකරුවන්ගෙන් සහ රු.මිලියන 31 ක් ජාතික රක්ෂණ භාර අරමුදලෙන් (NITF) ලැබිය යුතුය. 2024 දෙසැම්බර් 31 දිනට පවතින මූලික හිමිකම් සම්පූර්ණයෙන්ම පියවා තිබියදීත් මෙම තත්ත්වය අඛණ්ඩව පවතී. මෙම ශේෂ දිගු කාලීනව අයකර නොගැනීම තුළින් පියවීමේ ක්‍රියාවලිවල සිදු විය හැකි ප්‍රමාදයන් පෙන්නුම් කරන අතර එමඟින්, වැඩි වූ ණය අවදානම, ද්‍රවශීලතා සීමා සහ ප්‍රතිරක්ෂණ ගිණුම් සැසඳීමේ අභියෝගවලට සමාගම නිරාවරණය වීමේ හැකියාවක් පවතී.	සටහන් කර ගන්නා ලදී. දින 365කට අධික කාලයක් පැවති ලැබිය යුතු ප්‍රතිරක්ෂණ මුදල වූ ශ්‍රී ලංකා රුපියල් 30,476,246.25කින් ශ්‍රී ලංකා රුපියල් 12,701,544.78ක් අප විසින් අයකරගෙන ඇත. අනාගතයේදී, පද්ධතිය තුළින් ජනනය කරන ලද ලැබිය යුතු ප්‍රතිරක්ෂණ වයස්ගත වීමේ වාර්තාවට අනුව, ප්‍රතිරක්ෂණ අයකර ගැනීමේ ක්‍රියාවලිය සමීපව අධීක්ෂණය කරනු ලැබේ. ලැබිය යුතු ප්‍රතිරක්ෂණ මුදල් දින 300 ක් ඇතුළත ලබා ගැනීම සඳහා මෙම ක්‍රියාවලිය ක්‍රියාත්මක කර ඇත. දින 300 ක් ඇතුළත නොලැබුණහොත්, අදාළ ප්‍රතිරක්ෂණකරුවන්ට ගෙවිය යුතු වාරිකවලින් නියමිත මුදල් හිලව් කිරීමට අවශ්‍ය පියවර ගනු ලැබේ. ගෙවිය යුතු වාරික මුදල් නොතිබේ නම්, අදාළ ප්‍රතිරක්ෂණකරු වෙත එන්තරවාසියක් යවනු ලැබේ.	කළමනාකාරිත්වය විසින් ප්‍රතිරක්ෂණ ලැබිය යුතු මුදල්, විශේෂයෙන් දින 365 න් ඔබ්බට හිඟව පවතින මුදල් සම්බන්ධයෙන් අධීක්ෂණය කර අයකර ගැනීමේ ක්‍රියාවලිය ශක්තිමත් කළ යුතු බව නිර්දේශ කෙරේ. ප්‍රතිරක්ෂණ ගිණුම්වල විධිමත් සැසඳුම් පවත්වා ගනිමින් සහ අයකර ගැනීමේ ප්‍රයත්නයන්ට සහාය වීම සඳහා සන්නිවේදන මාර්ග ලේඛනගත කරමින්, විදේශීය ප්‍රතිරක්ෂණකරුවන් සහ ජාතික රක්ෂණ භාර අරමුදල (NITF) යන දෙඅංශයම සඳහා ව්‍යුහගත කළ පසු විපරම් යාන්ත්‍රණයක් සහ අය කර ගැනීම කඩිනම් කිරීමේ යාන්ත්‍රණයක් ස්ථාපනය කිරීම මෙයට ඇතුළත් විය යුතුය.

1.6.2 ගෙවිය යුතු මුදල්

විගණන නිරීක්ෂණය	කළමනාකරණයේ අදහස් දැක්වීම	නිර්දේශය
අ. හඳුනා නොගත් තැන්පතුවලින් සමන්විත වන රු. 227,582,132 ක අතිරික්ත වාරික ශේෂයක් 2024 දෙසැම්බර් 31 දින වන විට දින 365 කට අධික කාලයක් හිඟව පවතින බව නිරීක්ෂණය විය. මෙම ශේෂය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සැලකිය යුතු මට්ටමින් වැඩි වී ඇත. ස්ථාපිත ක්‍රියාවලියට අනුව, තැන්පත්කරු හඳුනා ගැනීමෙන් පසු, පාරිභෝගිකයාට නව රක්ෂණ සහතිකයක් නිකුත් කරන විට, අතිරික්ත වාරික මුදල සඳහා හර සටහනක් ලබා දෙනු ලැබේ. මෙම	අතිරික්ත වාරික සැසඳීම සඳහා 2025 අප්‍රේල් 10 දින නව ක්‍රියාවලියක් ආරම්භ කළෙමු. එතැන් සිට, ප්‍රධාන එකතු කිරීමේ ගිණුමට ශ්‍රී ලංකා රුපියල් මිලියන 269 ක් එකතු වී තිබුණු අතර 2025 ජූලි 31 දින වන විට ශ්‍රී ලංකා රුපියල් මිලියන 233 ක් (87%) පියවන ලදී. 2025 ජූලි 31 දිනට ඉතිරිව පැවති නොපියවන ලද ශේෂය රු. මිලියන 36 ක් (13%) විය. අඛණ්ඩව ක්‍රියාත්මක වන	කළමනාකාරිත්වය විසින් දිගුකාලීනව පවතින රු. මිලියන 227.6 ක් වූ අතිරික්ත වාරික ශේෂය පිළිබඳව සවිස්තරාත්මක සමාලෝචනයක් සිදු කර එය කලට වේලාවට අයකර ගැනීම සහතික කිරීම සඳහා ව්‍යුහගත ක්‍රියාවලියක් ස්ථාපනය කළ යුතු බව නිර්දේශ කෙරේ. අතිරික්ත වාරික ගිණුම් සැසඳීම, ගනුදෙනුකරුවන් සඳහා පසු විපරම් යාන්ත්‍රණ ශක්තිමත් කිරීම සහ නිශ්චිත

ශේෂය දිගු කාලීනව සමුච්චය වීම මගින් පියවීමේ ප්‍රමාදයන් පෙන්නුම් කරන අතර කලට වේලාවට අයකර ගැනීම සහ අතිරික්ත වාරික ගිණුම් නිසි ලෙස කළමනාකරණය කිරීම සහතික කිරීම සඳහා සමීප සමාලෝචනයක් සහ පසු විපරමක් සිදු කිරීම අවශ්‍ය වේ.	සැසඳීමේ ක්‍රියාවලියක් ද පවතී.	කාලරාමුවලින් ඔබ්බට හිඟව පවතින ශේෂ කඩිනමින් අයකර ගැනීමේ ක්‍රියා පටිපාටි හඳුන්වා දීම මෙයට ඇතුළත් විය යුතුය.
ආ. දින 365 කට අධික කාලයක් හිඟව පවතින රු. 238,706,772ක් වූ දිගුකාලීන හිඟ මෝටර් රථ හිමිකම් පැවතුනි.	සටහන් කර ගන්නා ලදී. මෙම දිගුකාලීන හිඟ ශේෂවලින්, හිමිකම් පෑම් 81% කට වඩා වැඩි ප්‍රමාණයක් අධිකරණ තීන්දු ලැබීමට නියමිත තෙවන පාර්ශවීය හිමිකම් වේ. මෙම හිමිකම් පෑම් හැසිරවීම සඳහා නීති දෙපාර්තමේන්තුව සතුව ව්‍යුහගත ක්‍රියාවලියක් ඇත. දිගුකාලීන හිඟ මෝටර් රථ හිමිකම්වලින් 19% ක් වූ ශේෂය තම වාහනවලට සිදු වූ හානි සඳහා වූ හිමිකම් ඉල්ලීම් වන අතර, අවශ්‍ය සියලුම ලේඛන ලැබීමෙන් පසුව සහ සියලුම අවශ්‍යතා සම්පූර්ණ කිරීමෙන් පසුව, වැඩ කරන දින 2 ක් ඇතුළත එම හිමිකම් ඉල්ලීම් පියවනු ලැබේ.	කළමනාකාරිත්වය විසින් දිගුකාලීනව පවතින මෝටර් රථ හිමිකම් ශේෂ සඳහා ව්‍යුහගත පසු විපරම් කිරීමේ සහ පියවීමේ ක්‍රියාවලියක් ක්‍රියාත්මක කළ යුතු බව නිර්දේශ කෙරේ. හිමිකම් ගිණුම් නිතිපතා සැසඳීම, කල් ඉකුත් වූ හිමිකම් පියවීම කාලීන ලෙස ඉහළ නැංවීම සහ පියවීමේ ප්‍රමාදයන් සඳහා පැහැදිලි වගවීමක් ශේෂයක් පැවතීම මෙයට ඇතුළත් විය යුතුය.

1.7 නීති, රීති, රෙගුලාසිවලට සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූලවීම

නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	**අනුකූල නොවීම**	**කළමනාකරණයේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
අ. ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ 03 වන නිශ්චය කිරීම	එම නිශ්චය කිරීම අනුව, වාරික ගෙවීමේ කාල සීමාව වාරිකය ගෙවිය යුතු දින සිට දින 60 ක් ලෙස නියම කෙරේ. කෙසේ වුවද, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ අංක 03 දරන නිශ්චය කිරීමට පටහැනිව සහ එම නිශ්චය කිරීමට අනුකූල නොවන පරිදි කටයුතු කිරීම	සටහන් කර ගන්නා ලදී. රක්ෂණ සමාගම් විවිධ පාරිභෝගික කාණ්ඩ සමඟ විවිධ ණය විධිවිධාන ඇති කර ගන්නා අතර රක්ෂණ කර්මාන්ත සංසදවලදී මේ පිළිබඳව සාකච්ඡා පවත්වා ඇත. සමස්ත	වාරිකය ගෙවිය යුතු දින සිට දින 60ක් ඇතුළත වාරික පියවීම අවශ්‍ය වන ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ අංක 03 දරන නිශ්චය කිරීමට පූර්ණ වශයෙන්ම අනුකූලව කටයුතු කරන බව කළමනාකාරිත්වය විසින් සහතික කළ යුතු බව නිර්දේශ

සඳහා අනුමැතිය ලබා නොගෙන සමාගම ණය කාලය භාවිතා කර තිබුණි. විස්තර පහත දක්වා ඇති පරිදි වේ.

- සම්පූර්ණ වාරිකය පියවා නොමැති නම්, නැවත පත් කළ තැරැව්කරු, මූල්‍ය සමාගම, බැංකුව, පීඑල්සී, පීපල්ස් ක්ෂුද්‍ර මූල්‍ය, කණ්ඩායම් කාර්ය මණ්ඩල ප්‍රතිපත්ති දින 100ක් ඇතුළත (ආරම්භක දිනයේ සිට) අවලංගු කරනු ඇත.

- සම්පූර්ණ වාරිකය පියවා නොමැති නම්, මෝටර් රථ සහ මෝටර් රථ නොවන අයිතම සඳහා වන රජයේ ටෙන්ඩර් ප්‍රතිපත්ති දින 180ක් ඇතුළත අවලංගු කරනු ඇත.

- සම්පූර්ණ වාරිකය නොලැබුනේ නම්, සියලුම සෘජු, නියෝජිත, ව්‍යාපාර ප්‍රවර්ධක ප්‍රතිපත්ති 65 වන දින අවලංගු කරනු ඇත.

- සම්පූර්ණ වාරිකය පියවා නොමැති නම්, මහජන බැංකුවේ මූල්‍ය පොලී සහිත ප්‍රතිපත්ති දින 120ක් ඇතුළත අවලංගු කරනු ඇත.

- සම්පූර්ණ වාරිකය නොලැබුනේ නම්, සම-රක්ෂණ (අභ්‍යන්තර) ප්‍රතිපත්ති දින 360ක් ඇතුළත අවලංගු කරනු ඇත.

සමුද්‍ර භාණ්ඩ ප්‍රවාහන ප්‍රතිපත්ති යටතේ දින 120ක ණය සඳහා අවසර දිය හැකිය.

ණය කාලය දින 60 කට සීමා කිරීම අවාසිදායකය. කෙසේ වුවද, රක්ෂණ නියාමන කොමිෂන් සභාව මේ වන විට ණය කාල සීමා සම්බන්ධයෙන් රක්ෂණ සමාගම් සමඟ සාකච්ඡා කරමින් සිටියි.

කෙරේ. නියමිත ණය කාල සීමාවෙන් අපගමනය වීමක් සිදු කළ යුත්තේ නියාමකයාගේ පූර්ව අනුමැතිය සහිතව පමණි.

1.8 මුදල් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	කළමනාකරණයේ අදහස් දැක්වීම	නිර්දේශය
අ. රු. 26,666,225 ක හඳුනා නොගත් ණය ශේෂයක් බැංකු සැසඳුම් ප්‍රකාශනවල නිත්‍ය වශයෙන්ම දක්නට ලැබෙන අතර එය සමාගමේ ගිණුම් වාර්තාවල සටහන් වී නොමැති බව නිරීක්ෂණය විය.	මාසය අවසානයේ වාර්තා කරන ලද හඳුනා නොගත් ණය හඳුනාගෙන නිරවුල් කරන තුරු මාස දෙකක කාලයක් බැංකු සැසඳුම් ප්‍රකාශනයේ පවතිනු ඇත. සමාගම විසින් අනුගමනය කරනු ලබන සම්මත කාලරාමු ක්‍රියා පටිපාටිය මෙයයි.	බැංකු සැසඳුම්වල දක්වා ඇති රු.26,666,225ක් වූ හඳුනා නොගත් ණය ශේෂය කළමනාකාරීත්වය විසින් සමාලෝචනය කර එහි මූලාශ්‍රය හඳුනා ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු බව නිර්දේශ කෙරේ. ඊට අමතරව, නැවත සිදුවීම වැළැක්වීමට සහ මූල්‍ය වාර්තාකරණයේ නිරවද්‍යතාවය සහ සම්පූර්ණත්වය සහතික කිරීම සඳහා කළමනාකාරිත්වය විසින් කාලීන සමාලෝචන සිදු කිරීම සහ පැහැදිලි නොකළ ශේෂ පසු විපරම් කිරීම ඇතුළුව බැංකු සැසඳුම් ක්‍රියා පටිපාටි ශක්තිමත් කළ යුතුය.

1.9 තොරතුරු තාක්ෂණ පොදු පාලන

විගණන නිරීක්ෂණය	කළමනාකරණයේ අදහස් දැක්වීම	නිර්දේශය
අ. සාමාන්‍ය රක්ෂණ පද්ධතිය තුළ විහිදුම් නිලධාරීන් විසින් සිදු කරනු ලබන වරප්‍රසාද ලත් ක්‍රියාකාරකම් පිළිබඳව සමාගම විසින් ප්‍රමාණවත් අධීක්ෂණ යාන්ත්‍රණ ස්ථාපනය කර නොමැති බව නිරීක්ෂණය විය. එවැනි අධීක්ෂණයක් නොමැතිකම තුළින්, පද්ධතිවල අනවසර වෙනස්කම් සිදු කිරීමේ, දත්ත හැසිරවීමේ හෝ අනාවරණය නොකළ දෝෂ ඇතිවීමේ අවදානම වැඩි කරන අතර එමඟින් තොරතුරු තාක්ෂණ පොදු පාලනවල සමස්ත කාර්යක්ෂමතාව දුර්වල කරන අතර තීරණාත්මක ව්‍යාපාරික දත්තවල අඛණ්ඩතාව, රහස්‍යභාවය සහ විශ්වසනීයත්වය ද අවදානමට ලක් කරයි.	නිරීක්ෂණවලට එකඟ වන අතර ඒවා ක්‍රියාත්මක කරන ලදී.	කළමනාකාරීත්වය විසින් සාමාන්‍ය රක්ෂණ පද්ධතියේ විහිදුම් නිලධාරීන් විසින් සිදු කරනු ලබන වරප්‍රසාද ලත් ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ශක්තිමත් අධීක්ෂණ පාලන ක්‍රියාත්මක කළ යුතු බව නිර්දේශ කෙරේ. සවිස්තරාත්මක විගණන ලොග් පවත්වා ගැනීම, වරප්‍රසාද ලත් ක්‍රියාමාර්ග පිළිබඳ ස්වාධීන සමාලෝචන වරින් වර ක්‍රියාත්මක කිරීම සහ හැකි අවස්ථාවලදී රාජකාරි වෙන් කිරීම බලාත්මක කිරීම මෙයට ඇතුළත් විය යුතුය.
ආ. 2024 දෙසැම්බර් 31 දිනට සාමාන්‍ය රක්ෂණ පද්ධතිය (GIS) සහ ජනතා මානව සම්පත් පද්ධතිය තුළ ඉල්ලා අස්වූ සේවකයින්ගේ පරිශීලක ගිණුම් කලට වේලාවට අක්‍රිය කර නොමැති බව නිරීක්ෂණය විය. සාමාන්‍ය රක්ෂණ පද්ධතිය (GIS) තුළ දින 21 ක් දක්වා	ඉල්ලා අස්වූ සේවකයින්ගේ ගිණුම් කලට වේලාවට අක්‍රිය කිරීම සඳහා පද්ධතියක්	සාමාන්‍ය රක්ෂණ පද්ධතිය සහ ජනතා මානව සම්පත් පද්ධතිය යන දෙකෙහිම ඉල්ලා අස්වූ සේවකයින්ට අයත් ගිණුම් කලට වේලාවට අක්‍රිය කිරීම සහතික කිරීම සඳහා කළමනාකාරීත්වය විසින් පරිශීලක ප්‍රවේශ කළමනාකරණ පාලන ශක්තිමත්

	වූ උපරිම ප්‍රමාදයන් සහිත අවස්ථා නවයක් සටහන් වූ අතර, ජනතා මානව සම්පත් පද්ධතිය තුළ දින 18 ක් දක්වා උපරිම ප්‍රමාදයන් සහිත වූ අවස්ථා 12 ක් හඳුනාගෙන තිබුණි.	ක්‍රියාත්මකව පවතී.	කළ යුතු බව නිර්දේශ කෙරේ.
ඇ.	සාමාන්‍ය රක්ෂණ පද්ධතිය සහ ජනතා මානව සම්පත් පද්ධතිය යන දෙකෙහිම පවතින ඉල්ලා අස්වූ සේවකයින්ගේ පරිශීලක ගිණුම් කඩිනමින් අක්‍රිය කර නොමැති බව නිරීක්ෂණය විය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, අදාළ ඉල්ලා අස්වීමේ දිනවලින් ඔබ්බට පරිශීලක ගිණුම් තුනක් ක්‍රියාකාරීව පැවති අතර ජනතා මානව සම්පත් පද්ධතියට ප්‍රවේශ වීමට එම ගිණුම් භාවිතා කර තිබුණි. මෙමඟින්, පරිශීලක ප්‍රවේශ කළමනාකරණ පාලනයන්හි දුර්වලතාවයක් පෙන්නුම් කරන අතර එමඟින් අනවසර ප්‍රවේශවීම්වලට හෝ අනිසි භාවිතය පිළිබඳ අවදානම්වලට පද්ධතිය නිරාවරණය වේ.	පරිශීලක ගිණුම් කඩිනමින් අක්‍රිය කිරීම සිදු වෙමින් පවතී.	සේවකයන් ඉල්ලා අස්වීමෙන් පසු, පරිශීලක ගිණුම් වහාම අක්‍රිය කිරීම සහතික කිරීම සඳහා කළමනාකාරීත්වය විසින් විධිමත් ක්‍රියාවලියක් ස්ථාපනය කර බලාත්මක කළ යුතු බව නිර්දේශ කෙරේ. මෙම ක්‍රියාවලියට මානව සම්පත් ඉවත් කිරීමේ ක්‍රියාවලියට සම්බන්ධ වූ ස්වයංක්‍රීය ප්‍රේරක, ක්‍රියාකාරී ගිණුම් සම්බන්ධ කාලානුරූප සමාලෝචන සහ ඕනෑම ව්‍යතිරේකයක් වහාම හඳුනාගෙන නිවැරදි කිරීම සඳහා අධීක්ෂණ යාන්ත්‍රණ ඇතුළත් විය යුතුය.
ඈ.	සමාගමේ වත්මන් වෙනස කළමනාකරණ පිළිවෙත් “තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්‍රියා පටිපාටි අත්පොතෙහි” අර්ථ දක්වා ඇති ප්‍රමිතීන් හා ක්‍රියා පටිපාටිවලින් අපගමනය වීමක් නිරීක්ෂණය වූ අතර, එමඟින්, ස්ථාපිත තොරතුරු තාක්ෂණ පාලන රාමුවලට අනුගත වීමේ දී පරතර ඇති විය හැකිය. එවැනි අපගමන පද්ධති දෝෂ ඇතිවීමේ අවදානම වැඩි කිරීමට සහ තීරණාත්මක ව්‍යාපාර මෙහෙයුම්වලට බාධා ඇති වීමට හේතු විය හැකිය.	නිරීක්ෂණය සමඟ එකඟ වන අතර එය සම්පූර්ණ කරන ලදී.	සැබෑ පරිචයට අනුකූල වීම සඳහා, ලේඛනගත ක්‍රියා පටිපාටිවලට වෙනස කළමනාකරණ කමිටුවේ (CMC) සහභාගීත්වය විශේෂයෙන් ඇතුළත් කරමින්, වත්මන් වෙනස කළමනාකරණ පිළිවෙත් නිවැරදිව පිළිබිඹු කිරීම සඳහා “තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්‍රියා පටිපාටි අත්පොත” යාවත්කාලීන කිරීම වැදගත් වේ.
ඉ.	ආපදා ප්‍රතිසාධන (DR) අඩවියේ ක්‍රියාත්මක කරන ලද පෙරිමීටර් ෆයර්වෝලයක් (Perimeter Firewall) නොමැති බව නිරීක්ෂණය විය. එමඟින් තීරණාත්මක පද්ධති සහ සංවේදී දත්ත අනවසර ප්‍රවේශයට සහ බාහිර සයිබර් තර්ජනවලට නිරාවරණය වේ. මෙම මූලික ජාල ආරක්ෂණ පාලනය නොමැතිකම මගින් රහස්‍ය දත්ත නිරාවරණය වීමේ අවදානම, පරිගණක පද්ධතිවල ආරක්ෂාව බිඳ වැටීමේ අවදානම, සහ ව්‍යසනයකදී ව්‍යාපාර අඛණ්ඩතාවයට බාධා ඇති වීමේ අවදානම වැඩි කරයි.	නිරීක්ෂණය සමඟ එකඟ වන අතර එය සම්පූර්ණ කරන ලදී.	අනවසර ප්‍රවේශවීම්වලින් සහ බාහිර සයිබර් තර්ජනවලින් තීරණාත්මක පද්ධති සහ දත්ත ආරක්ෂා කිරීම සඳහා කළමනාකාරීත්වය විසින් ආපදා ප්‍රතිසාධන (DR) අඩවියේ පෙරිමීටර් ෆයර්වෝලයක් ක්‍රියාත්මක කළ යුතු බව නිර්දේශ කෙරේ. ඊට අමතරව, ආපදා ප්‍රතිසාධන (DR) අඩවියේ ජාල ආරක්ෂණ පාලන සඵලදායී වන අතර සංවිධානයේ තොරතුරු තාක්ෂණ ආරක්ෂක ප්‍රතිපත්ති සමඟ ගළපා ඇති බව සහතික කිරීම සඳහා කලින් කල සමාලෝචනය කර පරීක්ෂා කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵලය

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 701,615,545ක බදු ගෙවීමට පෙර ලාභයක් වූ අතර, ඉකුත් වර්ෂයේ ඊට අනුරූප බදු ගෙවීමට පෙර ලාභය රු. 784,475,986ක් විය. එබැවින්, මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.82,860,441ක පිරිහිමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට හේතු වූයේ ප්‍රාරක්ෂණ සහ ශුද්ධ අත්පත් කර ගැනීමේ පිරිවැය රු. 231,371,885 කින් වැඩිවීමයි.

2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

පූර්ව වර්ෂ හතර (04) සමඟ සැසඳීමේ දී, සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන ආදායම් සහ වියදම් අයිතමවල වැඩිවීමේ හෝ අඩුවීමේ ප්‍රතිශතය පිළිබඳ විශ්ලේෂණය පහත පරිදි වේ.

රේඛීය අයිතමය	2024	2023	2022	2021	2020
	රු.මිලියන	රු.මිලියන	රු.මිලියන	රු.මිලියන	රු.මිලියන
සමාගම					
ආදායම	**5,928.20**	**5,629.84**	**6,394.66**	**5,905.72**	**6,162.73**
විචලනය	298.366	(764.829)	488.944	(257.010)	54.210
වැඩි වීම/(අඩු වීම)	5.30%	-11.96%	8.28%	-4.17%	0.89%
දළ ලිඛිත වාරිකය	**6,249.30**	**5,762.72**	**6,132.05**	**5,967.95**	**6,011.56**
විචලනය	486.572	(369.327)	164.100	(43.610)	(18.410)
වැඩි වීම/(අඩු වීම)	8.44%	-6.02%	2.75%	-0.73%	-0.31%
ශුද්ධ ඉපැයූ වාරිකය	**4,713.23**	**4,170.20**	**4,991.77**	**5,120.62**	**5,303.39**
විචලනය	543.028	(821.571)	(128.850)	(182.770)	41.660
වැඩි වීම/(අඩු වීම)	13.02%	-16.46%	-2.52%	-3.45%	0.79%
ආයෝජන ආදායම	**1,178.78**	**1,458.34**	**1,305.87**	**657.53**	**751.88**
විචලනය	(279.552)	152.466	648.340	(94.350)	(29.460)
වැඩි වීම/(අඩු වීම)	-19.17%	11.68%	98.60%	-12.55%	-3.77%
ශුද්ධ උපලබ්ධි (අලාභය) / ලාභ	**18.06**	**-**	**(402.61)**	**383.99**	**808.18**
විචලනය	18.064	402.610	(786.600)	(424.190)	742.940
වැඩි වීම/(අඩු වීම)			-204.85%	-52.49%	1138.78%
මුළු ආදායම	**5,928.20**	**5,629.84**	**6,394.66**	**5,905.72**	**6,162.74**
විචලනය	298.366	(764.825)	488.940	(257.015)	54.215
වැඩි වීම/(අඩු වීම)	5.30%	-11.96%	8.28%	-4.17%	0.89%
ශුද්ධ ප්‍රතිලාභ සහ හිමිකම්	**3,129.71**	**3,125.71**	**3,638.29**	**2,994.31**	**2,699.55**
විචලනය	4.002	(512.585)	643.980	294.760	(853.020)
වැඩි වීම/(අඩු වීම)	0.13%	-14.09%	21.51%	10.92%	-24.01%

ප්‍රාරක්ෂණ සහ අත්පත් කර ගැනීමේ පිරිවැය (ප්‍රතිරක්ෂණය ඇතුළුව)	**490.55**	**259.17**	**477.37**	**527.06**	**559.53**
විචලනය	231.372	(218.196)	(49.690)	(32.470)	42.380
වැඩි වීම/(අඩු වීම)	89.27%	-45.71%	-9.43%	-5.80%	8.19%
වෙනත් මෙහෙයුම් සහ පරිපාලන වියදම්	**1,643.59**	**1,474.02**	**1,239.84**	**1,203.69**	**1,216.19**
විචලනය	169.571	234.183	36.150	(12.500)	115.500
වැඩි වීම/(අඩු වීම)	11.50%	18.89%	3.00%	-1.03%	10.49%
ආදායම් බදු වියදම්	**272.19**	**262.90**	**364.32**	**189.42**	**472.21**
විචලනය	9.296	(101.422)	174.900	(282.790)	207.830
වැඩි වීම/(අඩු වීම)	3.54%	-27.84%	92.33%	-59.89%	78.61%
වර්ෂයේ ශුද්ධ ලාභය	**429.42**	**521.58**	**635.96**	**979.67**	**1,195.31**
විචලනය	(92.157)	(114.382)	(343.710)	(215.640)	547.660
වැඩි වීම/(අඩු වීම)	-17.67%	-17.99%	-35.08%	-18.04%	84.56%

2.3 අනුපාත විශ්ලේෂණය

ප්‍රවර්තන වර්ෂය සහ පසුගිය වර්ෂ සතර (04) සඳහා ගණනය කරන ලද සමාගමේ ප්‍රධාන අනුපාත පහත දැක්වේ.

සමාගම සඳහා නිශ්චිත අනුපාත	2024	2023	2022	2021	2020
රඳවා ගැනීමේ අනුපාතය	75.4%	72%	81.4%	85.8%	88.2%
මුළු හිමිකම් අනුපාතය (සාමාන්‍ය ව්‍යාපාරය)	66.4%	75.0%	72.9%	58.5%	50.9%
වියදම් අනුපාතය	44.5%	41.2%	33.7%	33.0%	32.9%
ඒකාබද්ධ අනුපාතය	111%	116%	107%	91%	84%
ලාභදායිතා අනුපාතය	11%	14%	16%	20%	28%
වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය	6%	7%	9%	11%	17%
හිමිකම් මත ප්‍රතිලාභ අනුපාතය	13%	16%	21%	24%	40%
ආයෝජනයේ ප්‍රතිලාභ අනුපාතය	12%	16%	15%	7%	9%
ද්‍රවශීලතා අනුපාතය	1.45	1.42	1.35	1.50	1.44
මුළු වත්කම් මත මූල්‍ය වත්කම් අනුපාතය	79%	80%	78%	82%	81%
තාක්ෂණික සංචිත අනුපාතයට ප්‍රාග්ධනය	128%	140%	114%	120%	112%
තාක්ෂණික සංචිත අනුපාතය	107%	111%	122%	123%	128%

ලාභදායිතාවය සහ ආයෝජන ප්‍රතිලාභ පිළිබිඹු කරන ප්‍රධාන මූල්‍ය අනුපාත කිහිපයක් වසරින් වසර ස්ථාවරව සහ සැලකිය යුතු මට්ටමින් අඩු වී ඇති බව නිරීක්ෂණය විය. විශේෂයෙන්, ලාභදායිතා අනුපාතය 2020 වර්ෂයේ දී 28% ක් වැනි ඉහළ අගයක සිට 2021 වර්ෂයේ දී 20% දක්වා ක්‍රමයෙන් අඩු වී ඇති අතර, 2022 වර්ෂයේ දී 16% දක්වාත්, පසුව 2023 වර්ෂයේ දී 14% දක්වාත්, 2024 වර්ෂයේ දී 11% ක් වැනි අඩු

අගයකටත් ළඟා වී ඇත. මෙම ප්‍රවණතාවයෙන් පෙන්නුම් කරන්නේ වසර පහක කාලය තුළ සමාගමට තම මෙහෙයුම් කටයුතුවලින් ලාභ උපයා ගැනීමේ හැකියාව ක්‍රමයෙන් අඩු වෙමින් පැවති බවයි.

එසේම, සමාගම ඉපැයීම් සඳහා තම වත්කම් භාවිතා කරන කාර්යක්ෂමතාව මනිනු ලබන වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය (ROA), 2020 වර්ෂයේ දී 17% සිට 2021 වර්ෂයේ දී 11% දක්වාත්, 2022 වර්ෂයේ දී 9% දක්වාත්, 2023 වර්ෂයේ දී 7% දක්වාත්, 2024 වර්ෂයේ දී 6% දක්වාත් පහත වැටී ඇත. මෙමගින් වත්කම් කළමනාකරණය සහ සම්පත් උපයෝජනයේ අඩුවන කාර්යක්ෂමතාවයක් දක්වයි.

එපමණක් නොව, සමාගම තම කොටස් හිමියන් සඳහා ප්‍රතිලාභ කොතරම් හොඳින් ජනනය කරන්නේද යන්න පිළිබඳ වැදගත් දර්ශකයක් වන කොටස් මත ප්‍රතිලාභ (ROE) අනුපාතය ද 2020 වර්ෂයේ පැවති අනුපාතය වූ 40% සිට 2021 වර්ෂයේ දී 24% දක්වාත්, 2022 වර්ෂයේ දී 21% දක්වාත්, 2023 වර්ෂයේ දී 16% ක් දක්වාත් 2024 වර්ෂයේ දී 13% දක්වාත් තියුණු ලෙස පහත වැටී ඇත. කොටස් මත ප්‍රතිලාභ (ROE) අනුපාතය සැලකිය යුතු අන්දමින් අඩුවීම මගින් කොටස් හිමියන්ගේ හිමිකම්වලට සාපේක්ෂව, ලාභදායීතාවයේ අඩුවීමක් පෙන්නුම් කරන අතර එමගින් ආයෝජකයන් සමාගම කෙරෙහි පවතින විශ්වාසයට බලපෑමක් සිදු විය හැකිය.

කර්මාන්තය සමඟ සංසන්දනය	**කර්මාන්තයේ වර්ධනය**					**සමාගමේ වර්ධනය**				
	2024	**2023**	**2022**	**2021**	**2020**	**2024**	**2023**	**2022**	**2021**	**2020**
ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවට අනුව	10.90 %	2.40 %	11.60 %	3.50 %	- 2.20 %	8.44 %	- 6.02 %	2.75 %	- 0.73 %	- 0.31 %

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 හඳුනාගත් පාඩු

විගණන නිරීක්ෂණය	**කළමනාකරණයේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
අ. පීපල්ස් ඉන්ෂුවරන්ස් පීඑල්සී හි වංචා විරෝධී ප්‍රතිපත්තියට අනුව, "වංචාවක් අනාවරණය වූ පසු, මානව සම්පත් අංශ ප්‍රධානියා විසින් අංශ ප්‍රධානීන්ගේ සහ ජ්‍යෝෂ්ඨ කළමනාකරු - නීති සහාය ඇතිව අදාළ පාඩු මුදල අයකර ගැනීමට හැකි සෑම උත්සාහයක්ම ගත යුතුය." කෙසේ වුවද, 2018 වසර වන තෙක් අවස්ථා කිහිපයකදී, සේවකයින් සිදු කළ වංචා සඳහා පාඩු පියවා ගැනීමෙන් තොරව සේවකයින්ගේ සේවය අවසන් කිරීම හෝ සේවකයන් ඉල්ලා අස්වීම හෝ සිදු වී තිබුණි. 2018 වර්ෂයේ සිට, වගුවේ දක්වා ඇති පරිදි එකතු කරන ලද වාරික අවභාවිතා කිරීම් වාර්තා විය. අභ්‍යන්තර පාලන දුර්වලතා හේතුවෙන් වසර ගණනාවක් තිස්සේ වංචා සිදුවෙමින් පැවතුනද, 2024 වර්ෂයේ දී ද එම ආකාරයේම වංචාවක් සිදුවී	පීපල්ස් ඉන්ෂුවරන්ස් පීඑල්සී හි විනය කමිටුව මගින් 2024 සිට ගනුදෙනුකරුවන්ගෙන් මුදල් එකතු කිරීමේදී සිදු වූ සියලුම වංචනික ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් පැමිණිල්ල ලැබී දින 14ක් ඇතුළත කටයුතු කර ඇත.	කළමනාකාරිත්වය විසින් සේවකයින් ඉල්ලා අස්වීමේ හෝ සේවය අවසන් කිරීමේ අවස්ථා ඇතුළත්ව සේවකයින්ගෙන් සිදු වන පාඩු කලට වේලාවට අයකර ගැනීම සහතික කිරීම සඳහා වංචා-විරෝධී ප්‍රතිපත්තිය බලාත්මක වීම ශක්තිමත් කළ යුතු බව ද, හඳුනාගත් වංචා නැවත සිදුවීම වැළැක්වීම සඳහා ශක්තිමත් අභ්‍යන්තර පාලන ක්‍රියාත්මක කළ යුතු බව ද නිර්දේශ කෙරේ.

තිබුණි. වංචා නැවත නැවත සිදුවීම වැළැක්වීම සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන ක්‍රියාත්මක කිරීමට අපොහොසත් වීම මගින් ආයතනයේ මූල්‍ය පැවැත්ම සඳහා සැලකිය යුතු මට්ටමේ අවදානම් ඇති වනු ඇත.

වර්ෂය	තනතුරු නාමය සහ අංශය	වංචා වර්ගය	මුදල (රු.)
2018	මාණ්ඩලික සහකාර I ශ්‍රේණිය	එකතු කරන ලද වාරිකය අයථා ලෙස පරිහරණය කිරීම	464,786.44
2019	PI කවුන්ටරය - ප්‍රාරක්ෂණ - හැටන්	එකතු කරන ලද වාරිකය අයථා ලෙස පරිහරණය කිරීම	215,514.76
2020	ජ්‍යෙෂ්ඨ විකුණුම් නිලධාරී - ජාඇල	එකතු කරන ලද වාරික අයථා ලෙස පරිහරණය කිරීම	57,379.00
2022	ජ්‍යෙෂ්ඨ විධායක - BLU ප්‍රධාන කාර්යාලය	වාරික අයථා ලෙස පරිහරණය කිරීම	සඳහන් කර නොමැත.
2023	ජ්‍යෙෂ්ඨ විකුණුම් නිලධාරී - රත්නපුර	වාරික අයථා ලෙස පරිහරණය කිරීම	224,798.68

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය	කළමනාකරණයේ අදහස් දැක්වීම	නිර්දේශය
අ. 2023 සහ 2024 වර්ෂ සඳහා රක්ෂණ ව්‍යාපාරයෙන් උපයාගත් අතිරික්තයේ අඩුවීම සෘණ ලෙස සටහන් වී ඇති අතර එම අතිරික්ත අනුපිළිවෙලින් රු. 675,160,124ක් සහ රු. 513,359,128ක් වේ. 2024 වර්ෂයේ දී මධ්‍යස්ථ හිමිකම් පාඩු අනුපාතය සියයට 66.40 ක් වුවද, වියදම් අනුපාතය සියයට 44.5 ක් ලෙස අධික ලෙස ඉහළ ගොස් ඇති අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් ඒකාබද්ධ අනුපාතය සියයට 111ක් බවට පත් වී ඇත. මෙයින් පෙන්නුම් කරන්නේ ප්‍රාරක්ෂණ පාඩු ප්‍රධාන වශයෙන් ඉහළ යන මෙහෙයුම් සහ අත්පත් කර ගැනීමේ පිරිවැය මගින් මෙහෙයවනු ලබන බවයි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, මෙම තත්ත්වය සමාගමේ සමස්ත ලාභදායිතාවයට සහ මූල්‍ය ස්ථාවරත්වයට අහිතකර ලෙස බලපා ඇත.	සටහන් කර ගන්නා ලදී.	අකාර්යක්ෂමතා ක්ෂේත්‍ර හඳුනා ගැනීම සහ පිරිවැය ප්‍රශස්තකරණ පියවර ක්‍රියාත්මක කිරීම සඳහා සමාගමේ මෙහෙයුම් සහ අත්පත් කර ගැනීමේ වියදම් පිළිබඳ පුළුල් සමාලෝචනයක් කළමනාකාරිත්වය විසින් සිදු කළ යුතු බව නිර්දේශ කෙරේ.

වර්ෂය	2024	2023
ප්‍රාරක්ෂණ ප්‍රතිඵල	- 513,359,128	- 675,160,124
පාඩු අනුපාතය	66.40%	74.95%
වියදම් අනුපාතය	44.5%	41.2%
ඒකාබද්ධ අනුපාතය	111%	116%

විගණන නිරීක්ෂණය	කළමනාකරණයේ අදහස් දැක්වීම	නිර්දේශය
ආ. භාර ගැනීමේ සහ අපහරණය කිරීමේ ක්‍රියාවලි මාර්ගෝපදේශයට අනුව, ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු-මෝටර් රථ හිමිකම් වෙතින් අනුමැතිය ලැබීමෙන් පසුව, අබලි ද්‍රව්‍ය තොගය දින හතක් ඇතුළත අපහරණය කළ යුතු අතර, අදාළ අබලි ද්‍රව්‍ය තොග ගැණුම්කරුවන්ට මෙම කාලය තුළ අයිතම එකතු කර ගන්නා ලෙස දැනුම් දිය යුතුය. උපරිම දින ගණන ඉක්මවා ගියහොත්, ශාඛා නිලධාරියා විසින් පද්ධතියේ පවතින අබලි ද්‍රව්‍ය	අබලි ද්‍රව්‍ය තොගය විකුණා ඇති බව සහ ගෙවීම් ලදුපත් අංකය පද්ධතියට ඇතුළත් කර ඇති බව සහතික කිරීම සඳහා අධීක්ෂණ යාන්ත්‍රණයක්	අබලි ද්‍රව්‍ය තොග අපහරණය කිරීමෙන් පසුව, සාමාන්‍ය රක්ෂණ පද්ධතිය කාලීනව යාවත්කාලීන කිරීම සහතික කිරීම සඳහා භාර ගැනීමේ සහ අපහරණය කිරීමේ ක්‍රියාවලි මාර්ගෝපදේශය දැඩි ලෙස පිළිපැදිය හැකි වන පරිදි කළමනාකාරිත්වය විසින් එය

තොගය අවලංගු කර නව අබලි ද්‍රව්‍ය තොගයක් ඇති කළ යුතුය. කෙසේ වුවද, සාමාන්‍ය රක්ෂණ පද්ධතියේ පවතින සමහර අනුමත අබලි ද්‍රව්‍ය තොග අපහරණය කිරීමෙන් පසු “විකිණී ඇත” ලෙස යාවත්කාලීන කිරීම වෙනුවට තවමත් “අනුමත කර ඇත” ලෙස පවතින බව නිරීක්ෂණය කළ හැකි විය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, සාමාන්‍ය රක්ෂණ ක්‍රමය තුළ ලදුපත් අංක සහ මුදල් ප්‍රමාණ ඒ අනුව යාවත්කාලීන නොකළ බැවින්, එකතුව රු. 4,530,340 ක් වූ අබලි ද්‍රව්‍ය තොගය විකුණා ඇත්දැයි තීරණය කිරීමට නොහැකි තත්ත්වයක් උද්ගත වී තිබුණි.	ක්‍රියාත්මක කර ඇත.	බලාත්මක කළ යුතු බව නිර්දේශ කෙරේ.

3.3 මෙහෙයුම් අකාර්යක්ෂතා

විගණන නිරීක්ෂණය	කළමනාකරණයේ අදහස් දැක්වීම	නිර්දේශය
අ. නව ග්‍රහණය වූ ව්‍යාපාර සඳහා අනුමත ක්‍රියාවලියට අනුව, "රක්ෂණ ඔප්පු නිකුත් කිරීමෙන් සති 2ක් ඇතුළත ප්‍රධාන කාර්යාලයට ප්‍රාරක්ෂණ ලේඛන නොලැබුණහොත්, ප්‍රධාන කාර්යාලයෙන් පොරොත්තු ප්‍රාරක්ෂණ ලේඛන ලැයිස්තුවක් පද්ධතිය තුළ ක්‍රියාත්මක කරනු ලබන අතර ඒ පිළිබඳව ශාඛාවේ ප්‍රාරක්ෂකයාට දැනුම් දෙනු ලැබේ". නව ග්‍රහණය නොවූ ව්‍යාපාර සඳහා වන මාර්ගෝපදේශවලට අනුව, සම්පූර්ණ රක්ෂණ ඔප්පු ලේඛන කට්ටලය රක්ෂණ ඔප්පුව නිකුත් කිරීමෙන් සතියක් ඇතුළත ප්‍රධාන කාර්යාලයට යැවිය යුතුය. කෙසේ වුවද, ශාඛාවේ 2024/2025 වර්ෂය සඳහා වූ විගණන වාර්තාවට අනුව, සම්පූර්ණ කරන ලද / සම්පූර්ණ නොකළ රක්ෂණ ඔප්පු ලේඛනය පහත දක්වා ඇති පරිදි ප්‍රධාන කාර්යාලයට යැවීමේ ප්‍රමාදයක් සිදු වී ඇති බව හඳුනා ගන්නා ලදී.	මාර්ගෝපදේශ දැනටමත් ක්‍රියාත්මක කර ඇත. ව්‍යතිරේක වාර්තාවක් මාසික පදනමින් පිළියෙළ කෙරේ. එම මාර්ගෝපදේශයන්ට අනුකූලව කටයුතු නොකළහොත්, ප්‍රාරක්ෂකයන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගනු ලැබේ.	කළමනාකාරීත්වය විසින් ග්‍රහණය වූ ව්‍යාපාර සහ ග්‍රහණය නොවූ ව්‍යාපාර සඳහා අදාළ නව ව්‍යාපාර මාර්ගෝපදේශවලට අනුකූල වන පරිදි, ශාඛාවලින් ප්‍රධාන කාර්යාලයට ප්‍රාරක්ෂණ සහ රක්ෂණ ඔප්පු ලේඛන ඉදිරිපත් කිරීම සඳහා අනුමත කාලරාමු දැඩි ලෙස පිළිපැදීම බලාත්මක කළ යුතු බව නිර්දේශ කරනු ලැබේ. කාලීන ව්‍යතිරේක වාර්තා, ප්‍රමාද වූ ඉදිරිපත් කිරීම් කඩිනමින් ඉදිරිපත් කිරීම සඳහා ක්‍රියා පටිපාටි සහ ශාඛා ප්‍රාරක්ෂකයන් සඳහා වගවීමේ යාන්ත්‍රණයන් වැනි සුදුසු අධීක්ෂණ පාලන ස්ථාපනය කළ යුතු වේ.

ශාඛාව	ප්‍රමාදය
ත්‍රිකුණාමලය	74
කඩුවෙල	58
හිඟුරක්ගොඩ	46
පානදුර	41
අම්බලන්ගොඩ	30
නිට්ටඹුව	29
කන්තලේ	22
බෙන්තොට	21
අකුරැස්ස	19

ආ. 2011 ජුලි 30 වන දින මහජන බැංකුවේ පුතුර් ශාඛාවේ සොරකමක් සිදු වූ අතර, එහි ප්‍රතිඵලයක් වශයෙන්, ග්‍රෑම් 26,554.75 ක් බරැති රත්‍රන් සහ ශ්‍රී ලංකා රුපියල් 3,640,000 ක මුදල් සොරකම් කරන ලද අතර මෙය ඔප්පු අංක 1HOFBP000000022 යටතේ ආවරණය කර ඇත. 2022 දෙසැම්බර් 31 දිනට, සමාගම විසින් මෙම හිමිකම් පෑම සඳහා ශ්‍රී ලංකා රුපියල් මිලියන 154.54 ක අත්තිකාරමක් ගෙවා ඇති අතර, එයින් ශ්‍රී ලංකා රුපියල් මිලියන 140.09ක් ප්‍රතිරක්ෂණකරුවන්ගෙන් අයකර ගෙන ඇත. ශ්‍රී ලංකා රුපියල් මිලියන 14.45ක් වූ ඉතිරි ශේෂය සමාගම විසින් දරන ලදී. සොරකම් කරන ලද රත්‍රන්වලින්, ග්‍රෑම් 13,093 ක් පමණක් නැවත ආපසු ලබාගෙන ඇත. 2025 පෙබරවාරි 3 වන දින සමාගම විසින් මුළු බර ග්‍රෑම් 8,574.45 ක් වන භාණ්ඩ 1,190 ක් සහ සහ ශ්‍රී ලංකා රුපියල් 3,633,000 ක මුදලක් භාරගත් බව පිළිගන්නා ලදී. අබිලි ද්‍රව්‍ය මණ්ඩල පත්‍රිකා අංක 45/2025 ට අනුව, සමාගම මෙම භාණ්ඩ කොටස් වශයෙන් විකිණීමේ ක්‍රියාවලියක නිරතව සිටි අතර, පසුව, අබිලි ද්‍රව්‍ය මණ්ඩල පත්‍රිකා අංක 45A/2025 ට අනුව, ලංසු තැබීමේ ක්‍රියාවලියක් හරහා භාණ්ඩ විකිණීමට පියවර ගන්නා ලදී. කෙසේ වුවද, ප්‍රතිරක්ෂණකරුවන් සහ අනෙකුත් අදාළ පාර්ශවයන් අතර අබිලි ද්‍රව්‍ය ප්‍රතිසාධන බෙදා හැරීමේ විකල්ප ප්‍රවේශයක් සලකා බලා ඇති බව සටහන් වූ නමුත් මෙම විකල්පය සම්බන්ධයෙන් වැඩිදුර ක්‍රියාමාර්ගයක් ගනු ලබන බව නිරීක්ෂණය කළ නොහැකි විය.

රන් ග්‍රෑම් 4,564.94 ක ප්‍රමාණයක් සහ රු. 2,467,000 ක මුදලක් මහජන බැංකුව විසින් භාර දිය යුතුව පවතී. සම්පූර්ණ අබිලි අයිතමය/මුදල් භාර දුන් පසු, අපි අදාළ කොටස්කරුවන් අතර කොටස් බෙදා හැරීමට කටයුතු කරන්නෙමු.

අබිලි ද්‍රව්‍ය මණ්ඩල පත්‍රිකා අංක 45A/2025 හි සලකා බලන ලද පරිදි, කළමනාකාරීත්වය විසින් ප්‍රතිරක්ෂණකරුවන් සහ අනෙකුත් අදාළ පාර්ශවයන් අතර අබිලි ද්‍රව්‍ය ප්‍රතිසාධන බෙදා හැරීමේ විකල්පය විධිමත් කර කාලෝචිත පියවර ගත යුතු බව නිර්දේශ කෙරේ. ඊට අමතරව, කළමනාකාරීත්වය විසින් ආපසු ලබා ගන්නා ලද භාණ්ඩ අපහරණය කිරීම හෝ විකිණීම විනිවිදභාවයෙන් හා අනුමත ක්‍රියා පටිපාටිවලට අනුකූලව සිදු කරන බවට සහතික කළ යුතු අතර, ඒ සම්බන්ධ ප්‍රගතිය පිළිබඳව සියලුම පාර්ශවකරුවන්ට දැනුම් දිය යුතුය.

3.4 ප්‍රසම්පාදන කළමනාකරණය

විගණන නිරීක්ෂණය — **කළමනාකරණයේ අදහස් දැක්වීම** — **නිර්දේශය**

අ. සමාගමේ ප්‍රසම්පාදන ප්‍රතිපත්තියේ සහ ප්‍රසම්පාදන අත්පොතෙහි, උපදේශකයින් තෝරා ගැනීම සහ සම්බන්ධ කර ගැනීම සඳහා වන ක්‍රියා පටිපාටි නිශ්චිතව දක්වා නොමැත. රජය සතු ව්‍යවසායක් ලෙස, ශ්‍රී ලංකා ජාතික ප්‍රසම්පාදන

'අලෙවිකරණ ප්‍රධානි' තනතුර 2022 වර්ෂයේ සිට පුරප්පාඩු වී ඇති අතර එම තනතුර ප්‍රධාන කළමනාකරණ පිරිස් (KMP) ලෙස වර්ගීකරණය කර නොමැති අතර ප්‍රධාන කළමනාකරණ පිරිස් (KMP) සඳහා අධ්‍යක්ෂ මණ්ඩල

විනිවිද පෙනෙන, තරඟකාරී සහ මනාව ලේඛනගතකරන ලද ක්‍රියා පටිපාටි සහතික කරමින්, ජාතික ප්‍රසම්පාදන නියෝජිතායතන

නියෝජිතායතනය විසින් නිකුත් කරන ලද උපදේශකයින් තෝරා ගැනීම සහ සේවයේ යෙදවීම පිළිබඳ මාර්ගෝපදේශවලට අනුකූලව කටයුතු කිරීමට සමාගම බැඳී සිටී. මෙම මාර්ගෝපදේශ මගින්, යොමුකිරීමේ අනුදේශ (TOR) සංවර්ධනය, ප්‍රචාරණය, සම්පූර්ණ කිරීමෙන් පසු තෝරා ගැනීම, පත්කිරීමේ නියම ඇතුළුව, තනි උපදේශකයකු තෝරා ගැනීම සඳහා විනිවිද පෙනෙන, තරඟකාරී සහ මනාව ලේඛනගත කරන ලද ක්‍රියාවලියක් ඉස්මතු කර දක්වයි. එසේ තිබියදීත්, සමාගම විසින් අවශ්‍ය මාර්ගෝපදේශ පිළිපැදීමෙන් තොරව, 2023 පෙබරවාරි 23 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතයක් මගින් අලෙවිකරණ උපදේශකයෙකු පත් කරන ලදී. තවද, පත් කරන ලද උපදේශකයා අලෙවිකරණ ප්‍රධානියා ලෙස නම් කරන ලද අතර එය සමාගමේ අනුමත බඳවා ගැනීමේ පටිපාටිය (SOR) සහ පත්වීම් ක්‍රියා පටිපාටියට අනුකූලව පිරවිය යුතුව තිබූ ස්ථිර සේවක තනතුරකි. උපදේශකවරයා මුලින් බඳවා ගනු ලැබුවේ 2023 **පෙබරවාරි** 9 දින සිට බලපැවැත්වෙන පරිදි මාස හයක තාවකාලික පදනමක් මත වන අතර, **මාසික ගාස්තුව රු.** 200,000 **කි**. පසුව ගිවිසුම තුන් වතාවක් දීර්ඝ කරන ලදී:

- **පළමු සේවා දිගුව**: 2023 අගෝස්තු 10 සිට, රු**. 250,000ක් වූ වැඩි කරන ලද මාසික ගාස්තුවක් සමඟ**
- **දෙවන සේවා දිගුව**: 2024 පෙබරවාරි 9 සිට **එම මාසික ගාස්තුව සමඟ**
- **තෙවන සේවා දිගුව**: 2024 අගෝස්තු 9 සිට 2025 පෙබරවාරි 8 දක්වා **මසකට රු. 250,000** බැගින්

ඊට අමතරව, 2023 දෙසැම්බර් 01 වන දින, සමාගම විසින් එම අලෙවිකරණ උපදේශකවරයාම ප්‍රධාන විධායක නිලධාරියා ලෙස කටයුතු කරන IKON සාමාජිකයින් සහ මෙහෙයුම් කළමනාකරණ කමිටුව (OMC) පමණක් ඇතුළත් වේ. මීට පෙර, ප්‍රධාන විධායක නිලධාරියා විසින් විධිමත් ක්‍රියාවලීන් හෝ අනුප්‍රාප්තිකයෙකු හෝ නොමැතිව අලෙවිකරණ කාර්යය පෞද්ගලිකව කළමනාකරණය කරන ලදී.

බහුවිධ සම්මුඛ පරීක්ෂණ සහ ඉහළ තනතුරක් සඳහා වෙනත් ආයතනවලින් සුදුසු පුද්ගලයෙකු පිළිබඳව සොයා බලන තැනැත්තන්ගේ සහභාගීත්වය තිබියදීත්, සමාගමට සුදුසු අපේක්ෂකයෙකු සොයා ගැනීමට නොහැකි විය. එබැවින්, අලෙවිකරණ කාර්යයන් විධිමත් කිරීම සහ වෙළඳ නාම දෘශ්‍යතාව පිරිවැය-ඵලදායී ලෙස වැඩි දියුණු කිරීම සඳහා පළපුරුදු උපදේශකයෙකු බඳවා ගැනීමට සමාගම තීරණය කරන ලදී. ප්‍රධාන විධායක නිලධාරියා විසින් මානව සම්පත් සහ වේතන කමිටුවට මෙම පත්කිරීම සිදු කරන ලෙස නිර්දේශ කළ අතර, අධ්‍යක්ෂ මණ්ඩලය එය අනුමත කරන ලදී. සාකච්ඡා පැවැත්වීමෙන් පසුව, රු. 200,000 දක්වා අඩු කරන ලද උපදේශන ගාස්තුව සඳහා අනුමැතිය ලබා දී තිබුණි. මෙය බොහෝ අපේක්ෂකයින් ඉල්ලා සිටි ප්‍රමාණයට වඩා අඩු ප්‍රමාණයක් විය. උපදේශකයාගේ කාර්යසාධනය මණ්ඩලය විසින් කාර්තුමය වශයෙන් ඇගයීමට ලක් කරන ලදී.

බාහිර සාකච්ඡා සහ අභ්‍යන්තර කුසලතා වර්ධනයට පහසුකම් සැලසීම සඳහා උපදේශකවරයාට 'අලෙවිකරණ ප්‍රධානියා' යන පදවි නාමය ලබා දෙන ලද නමුත් ස්ථිර සේවක ප්‍රතිලාභ ලබා දීමෙන් තොරව, බාහිර උපදේශකයෙකු ලෙසම දැඩි ලෙස සලකනු ලැබීය. සියලුම කොන්ත්‍රාත් දීර්ඝ කිරීම් සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය අවශ්‍ය වූ අතර, ඒ සඳහා වාසිදායක රැස්වීම් වාර්තා සහ කාර්යසාධන සමාලෝචන මගින් සහාය ලැබී තිබුණි.

මාර්ගෝපදේශවලට අනුකූලව උපදේශක බඳවා ගැනීම් ගළපා ගත යුතු බව සමාගමට නිර්දේශ කෙරේ. තවද, ප්‍රසම්පාදනවලදී හා පත්කිරීම්වලදී විනිවිදභාවය, අඛණ්ඩතාව සහ වගවීම ආරක්ෂා කිරීම සඳහා ගිවිසුම අවසන් කිරීම හෝ ප්‍රතිව්‍යුහගත කිරීම මගින් යම් උපදේශකයෙකුගේ කාර්යභාරය හේතුවෙන් පැන නගින බැඳියා පිළිගැටුම් සඳහා විසඳුම් ලබා ගත යුතුය.

සමාගම සමඟ සමාජ මාධ්‍ය සේවා ගිවිසුමකට එළඹුණි. මෙම විධිවිධානය මගින් උපදේශක ගිවිසුමේ 5(ආ) වගන්තියේ දක්වා ඇති පරිදි පැහැදිලිවම බැඳියා පිළිගැටුමක් ඇති කරයි. මෙම බරපතල ගැටළු තුළින් **උපදේශක තෝරා ගැනීමේ විනිවිදභාවය** පිළිබඳව සහ **විධායක කාර්යයන් පිළිබඳව නොසලකා හැරීම තුළින් කළමනාකාරිත්වයේ බැඳියා පිළිගැටුම** පිළිබඳවද සැකයක් ඇති කරයි.

මෙම සමාගම මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද 'රජය සතු ව්‍යවසායන් සඳහා මෙහෙයුම් අත්පොත' අනුගමනය කරයි. එසේ වුවද, කොළඹ කොටස් වෙළඳපොලේ (CSE) ලැයිස්තුගත සමාගමක් ලෙස, මෙම සමාගම මෙම අත්පොතට අනුකූලව කටයුතු කිරීමේ අවශ්‍යතාවෙන් නිදහස් කර ඇති අතර ඒ වෙනුවට, එම සමාගම 2007 අංක 7 දරන සමාගම් පනත මගින් පාලනය වේ. අධ්‍යක්ෂ මණ්ඩලයට සම්පූර්ණ කළමනාකරණ බලතල හිමි වන අතර සමාගමේ පූර්ණ යහපත වෙනුවෙන් ක්‍රියා කරමින් පනතට අනුව රාජකාරි පැවරිය හැකි වේ.

කොළඹ කොටස් වෙළඳපොලේ (CSE) ලැයිස්තුගත කිරීමේ රීතිවලට අනුව, අදාළ පාර්ශව හෝ වැදගත් මූල්‍ය ගනුදෙනු සඳහා හෙළිදරව් කිරීම අවශ්‍ය වන අතර ඒ සඳහා මණ්ඩලයේ /කොටස් හිමියන්ගේ අනුමැතිය ලබා ගැනීම අවශ්‍ය වේ. IKON සමාගම සමඟ ඇති කර ගත් ගිවිසුම උපදේශකවරයා සම්බන්ධ වීමට පෙර අත්සන් කරන ලද අතර, මෙම උපදේශකවරයා IKON සමාගම සමඟ ඇති කර ගත් කොන්ත්‍රාත්තුව සම්බන්ධ තෝරා ගැනීමේ ක්‍රියාවලියේ හෝ තීරණ ගැනීමේ ක්‍රියාවලියේ කොටසක් නොවීය. බැඳියා පිළිගැටුම් වැළැක්වීම සහ ස්වාධීනත්වය සහතික කිරීම සඳහා ඩිජිටල් අලෙවිකරණ වගකීම් උපදේශකයාගේ විෂය පථයෙන් නිශ්චිතවම ඉවත් කර එම වගකීම් මෙහෙයුම් ප්‍රධානියාට පවරන ලදී.